(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 55.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 පෙබරවාරි 23 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

32/2020

ගරු හේෂා විතානගේ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2020 දක්වා —

(i) ශ්‍රී ලංකාවේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ ගුවන්යානා ඉන්ධන ලීටරයක විකුණුම් මිලෙහි උච්චාවචනයන් සිදු වූ ආකාරය කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ගයේ ඉන්ධන ලීටරයක් මත පනවන ලද සියලුම බදු වර්ග කවරේද;

(iii) මෙම ඉන්ධන වර්ගයන්හි එක් ලීටරයක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවූ වියදම කවරේද;

(iv) ලෝක වෙළෙඳපොළ මිල ගණන් සමඟ සැසඳීමේ දී, ඉහත සඳහන් එක් එක් ඉන්ධන වර්ගයෙන් ලීටරයක් සඳහා රජය ලැබූ ලාභය/පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඩීසල් සහ පෙට්‍රල් විකුණුම් මිල වෙනස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එමඟින් රජය ලබන ලාභය/පාඩුව කොපමණද;

(iii) එමඟින් පාරිභෝගිකයන්ට ලැබෙන වාසි/අවාසි කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

2.

141/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් ඌව පළාත් සභාව සම්බන්ධයෙන් සිදු කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති මූල්‍ය අක්‍රමිකතා හා මූල්‍ය අවභාවිතා කිරීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති විගණන නිර්දේශ කවරේද;

(iv) එම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර කවරේද;

(v) මූල්‍ය අක්‍රමිකතා හා මූල්‍ය අවභාවිතා කිරීම් සම්බන්ධ දේශපාලන අධිකාරිත්වයට හා නිලධාරින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

173/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගල්කිස්ස මුහුදු තීරයේ වෙරළ ඛාදනය නතර කිරීම සඳහා රුපියල් මිලියන 890ක වියදමින් ක්‍රියාත්මක කරන ලද වැලි පෝෂණ ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ අනුමතිය ඇතිව ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලැබූ ක්‍රමවේදයේ ගැටලු හේතුවෙන් රජයට සිදු වූ පාඩුව සම්බන්ධයෙන් වත්මන් රජය ගනු ලබන පියවර කවරේද;

(ii) එම ව්‍යාපෘතිය අසාර්ථක වීමෙන් ගල්කිස්ස වෙරළ තීරයට හා මුහුදු පරිසර පද්ධතියට යම්කිසි හානියක් සිදු වී ඇත්නම්, එය යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

235/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ පදම් කළ සම් සහ සායම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම පදම් කළ සම් සහ සායම් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම පදම් කළ සම් සහ සායම් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට පදම් කළ සම් සහ සායම් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

265/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රත්මලානේ පිහිටි ප්‍රධාන නඩත්තු වැඩපළෙහි ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවත්;

(ii) මෙම හේතුව කාර්යක්ෂම දුම්රිය සේවයක් ස්ථාපිත කිරීමට බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රත්මලාන ප්‍රධාන නඩත්තු වැඩපළෙහි ධාරිතාවය වැඩි කිරීමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමට හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, මිලදී ගැනීමට අපේක්ෂිත යන්ත්‍ර සූත්‍ර කවරේද;

(iii) එම යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

487/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වැටුප් ප්‍රතිශෝධනයන් කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටුප් ප්‍රතිශෝධන මඟින් වැටුප් වැඩි වූ ප්‍රතිශතය කවරේද;

(iii) එම වැටුප් ප්‍රතිශෝධන සිදු වූ සේවා ඛණ්ඩ හා ඊට අදාළ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සිදු කරනු ලබන වැටුප් වැඩි කිරීම්වලදී ඉහළ නිලධාරීන් සම්බන්ධයෙන් පමණක් සුවිශේෂී අවධානයක් යොමු කර තිබෙන බවට චෝදනා නැගී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ආයතනයේ සේවයේ නියුතු සෑම සේවකයෙකුටම සමාන ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් වැටුප් ප්‍රතිශෝධන සිදු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

532/2020

ගරු රෝහණ බංඩාර මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ උග්‍ර පානීය ජල ගැටලු ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගම්මානවල ජනතාවගේ පානීය ජල ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

566/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු වී ඇති අලාභය කොපමණද;

(ii) එම අලාභය වළක්වා ගැනීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(iii) එම අලාභය පියවා ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, මන්ද?

9.

567/2020

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) මිනිස් සමේ පැහැය වෙනස් කරන / පැහැපත් කිරීමේ (සුදු පැහැගැන්වීමේ) ඖෂධ, පෙති, එන්නත් හා ආලේපන විශාල වශයෙන් ශ්‍රී ලංකාව තුළ අළෙවි කරමින් පවතින බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ අළෙවි කරන ඖෂධ අතරින් ආනයනය කරනු ලබන ඖෂධ සම්බන්ධයෙන් නියාමනය සිදු කරන ආයතනය;

(ii) එම නියාමනයන්ට අදාළ නීතිය;

කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ඖෂධ නියම කිරීම සිදු කරන බොහෝ දෙනෙකුට වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් නොමැති බව පිළිගන්නේද;

(ii) එම ඖෂධ භාවිතයෙන් කෙටි කාලීනව විවිධ ආසාත්මිකතා ඇති වන බව වාර්තා වී තිබේද;

(iii) ඖෂධ භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස දිගුකාලීනව භයානක රෝගී තත්ත්වයන් ඇතිවිය හැකි බවට පළ වන වෛද්‍ය මත පිළිබඳව අවධානය යොමු කර තිබේද;

(iv) එසේ නම්, එහිදී අනාවරණය වූ කරුණු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම ඖෂධ භාවිතයෙන් අහිතකර ප්‍රතිඵල ජනිත වේ නම්, එය වැළැක්විය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

579/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත ඉඩම් පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 1.00 දක්වා විය යුතු ය. අ.භා. 1.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 පෙබරවාරි 24 බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට පූ.භා. 11.30 දක්වා විය යුතු ය. පූ.භා. 11.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2020 නොවැම්බර් 28 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

4.

ගරු තිස්ස අත්තනායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

6.

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සිසිර ජයකොඩි සියපත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2021 පෙබරවාරි 10),— "1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ කියවිය යුතු, 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2199/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 29 දිනැති අංක 2199/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2021.02.11 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා (අංක 1),— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 05 දිනැති අංක 2209/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 19 දිනැති අංක 2198/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 29 දිනැති අංක 2199/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1353/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට 2019.11.16 දින දක්වා කාලය තුළ දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීම සඳහා පත්කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) එම කොමිෂන් සභාව පවත්වාගෙන යාම වෙනුවෙන් රජය විසින් දරන ලද සමස්ත වියදම කොපමණද;

(iii) එම කොමිෂන් සභාවේ සභාපති සහ එක් එක් සාමාජිකයාගේ වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සභාපතිවරයා ඇතුළු ඉහත කොමිෂන් සභා සාමාජිකයන් මේ වනවිට රජයේ තනතුරු දරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයා විසින් දරනු ලබන රජයේ තනතුරු සඳහා මාසිකව ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1354/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ සහ අග්‍රාමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1355/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ ජනාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1356/2020

ගරු අනුර දිසානායක මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ටින් මාළු තොග, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආපසු හරවා යවා තිබේද;

(ii) එසේ නම්, එසේ ආපසු හරවා යවන ලද දිනය, ප්‍රමාණය සහ ආපසු හරවා යැවීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ආපසු හරවා යවන ලද ටින් මාළු තොග ආනයනය කරන ලද ආයතනවල හෝ පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1357/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 දෙසැම්බර් 31 දින වනවිට "ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට" එකතු වී ඇති මුළු මුදල කොපමණද;

(ii) එම අරමුදලින් වියදම් කරන ලද මුදල, එක් එක් ශීර්ෂයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අරමුදල හා කොවිඩ්-19 වසංගතය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතුවලට වියදම් කරන ලද මුදල කොපමණද;

(iv) කොවිඩ්-19 වසංගතය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ ප්‍රචාරක කටයුතු සිදු කරන ලද ආයතන කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් ආයතනයට "ඉටුකම කොවිඩ් -19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලෙන්" ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?